# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2239/57 – 2021 අගෝස්තු 06 වැනි සිකුරාදා – 2021.08.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/01.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කුරුණෑගල, බෞද්ධාලෝක මාවත, අංක 104/16 හි පදිංචි ඩී. එන්. වීරතුංග මිය සහ කොළඹ 05, උද්‍යාන පාර, අංක 241 හි පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.05.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ජුනි මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය.**

ඩී. එන්. වීරතුංග මිය, අංක. 104/16, බෞද්ධාලෝක මාවත, කුරුණෑගල.

*පළමු පාර්ශවය*

*යොමු අංකය:* IR/COM/01/2019/01.
*නඩු අංකය:* A81/2020.

සහ

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

*දෙවන පාර්ශවය*


1A – G 34798 – 12(2021/08)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර පවත්නා කාර්මික ආරාවුල

*පළමු පාර්ශවය වෙනුවෙන්,*

පැමිණිලිකාරිය වෙනුවෙන් නීතිඥ නියෝජනයක් හෝ වෙනත් නියෝජනයක් නොතිබුණි.

*දෙවන පාර්ශවය වෙනුවෙන්,*

සහකාර අධ්‍යක්ෂ පාලන හිරනි තේනුවර මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ (නීති) හිමාෂා මුණසිංහ මහත්මිය පෙනී සිටී.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර මා වෙත යොමු කර ඇත.

එකී කාර්මික ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ:

"ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවය කරන ඩී. එන්. වීරතුංග මහත්මිය II ශ්‍රේණිය ගණකාධිකාරි තනතුරට බඳවාගෙන ඉන් පසුව ඇයගේ වැටුප අඩු කිරීම හා තනතුරට හිමි වරප්‍රසාද අහිමි කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

පළමු හා දෙවන පාර්ශයන් විසින් තම පළමු හා දෙවන ප්‍රකාශයන් ගරු බේරුම්කරණය වෙත ඉදිරිපත් කර තිබුණු අතර මෙකී ආරවුල සම්බන්ධයෙන් 2021.01.21 වන දින මෙම නඩුව කැඳවූ අතර එහි දී පළමු හා දෙවන පාර්ශවයන් වෙනුවෙන් කිසිදු නීතිඥ නියෝජනයක් නොතිබූ අතර පළමු පාර්ශවය සිය 2021.01.21 වන දින කරුණු දැක්වූ අතර පුවත්පත් දැන්වීමක පළ කරන ලද ගණකාධිකාරි තනතුරකට අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට මෙම රැකියාව ලබාගත් බවත්, එම දැන්වීමට අනුව මූලික වැටුප රු. 30575 ක් ලෙස සඳහන් කර තිබූ බවත් එම වැටුප එවකට ප්‍රවාහන කොමිෂන් සභාව තුළ කියාත්මක කරමින් තිබූ නෛතික ක්‍රමවේදයට අනුව ලබා දුන් වැටුපක් බවත් විස්තරාත්මකව පැහැදිලි කරන ලදී. තව ද 30/ 2006 චක්‍රලේඛය ප්‍රකාරව සේවක වරප්‍රසාද සකස් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව අනුගත වී නොසිටි බවත් සේවක මණ්ඩලයේ වරදක් නොවන බවත් එය කළමනාකරණ දෝෂයක් බවත් සඳහන් කරමින් කරුණු දක්වන ලදි.

ඒ අනුව 2016 වර්ෂයේ දී පළමු පාර්ශවයේ මූලික වැටුප රු. 25640 ක් බවට සඳහන් කරමින් ලිපියක් නිකුත් කළ බවත් මුල් වැටුප සමග පවතින වෙනස ගැලපුම් දීමනාවක් වශයෙන් ගෙවීමට කටයුතු කරන බව එම ලිපියෙන් දැනුම් දීමට ක්‍රියා කර ඇති බවත් සඳහන් කරන ලදි. මේ හේතුවෙන් වැටුප් වර්ධකවලින් ඇතිවන වැඩිවීම මෙම වෙනස සමග ගැලපීමක් සිදුකර එමගින් වැටුප් වර්ධක අහිමි වීමත්, එසේම වසර කීපයක් යන තෙක් වැටුප් වර්ධක නොලැබී යාම හේතුවෙන් බරපතල අසාධාරණයක් වන බවත් මූලික වැටුප අඩුවන නිසා වෛද්‍ය නිවාඩු ගණනය කිරීමේ දී හා අනෙකුත් ප්‍රතිලාභ ගණනය කිරීමේ දී හා අනෙකුත් ප්‍රතිලාහ ගණනය කිරීමේ මුල්‍යමය වශයෙන් බරපතල පාඩුවක් සිදුවන බව එය අසාධාරණ තත්ත්වයක් බවත් සඳහන් කරන ලදි.

ඒ අනුව පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාචික කරුණු දැක්වීමට අදාළව දෙවන පාර්ශවය විසින් පැහැදිලි කර ගැනීම් සිදු කරන ලදි. දෙවන පාර්ශවය විසින් බඳවා ගැනීම්වලට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛත් ඊට අදාළ නිකුත් කර ඇති උපදෙස් පිළිබඳවත් පළමු පාර්ශවය වෙතින් විමසන ලදි. එසේම ඊට අදාළ ලේඛන නිරීක්ෂණයට ද අවස්ථාව ලබා දෙන ලදි. ඒ අනුව දෙවන පාර්ශවය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුගත වීමට සිදුවන බවට අවබෝධයක් තිබිය යුතු බව පළමු පාර්ශවය වෙත යෝජනා කරන ලදි. එසේම මෙය පෞද්ගලික පළිගැනීමක් ලෙස සලකා වැටුප් පරිමාණයන් වෙනස් කිරීමට ආයතනය කටයුතු නොකරන බවත් දෙවන පාර්ශවය මගින් සඳහන් කරන ලදි.

මෙම කරුණු පැහැදිලි කිරීමට අදාළ වන ලේඛන සියල්ලම දෙවන පාර්ශවය විසින් බේරුම්කරු වෙත ඉදිරිපත් කරන ලද අතර දෙවන පාර්ශවය වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ පාලන විසින් තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීමට අවසර ඉල්ලා සිටින ලදි. එහි දී මූලික වැටුප නිවැරදි කරන අවස්ථාවකදී එය සමහර විට අඩු වැඩි වීම් වන්නට හැකියාවක් පවතින බවත් ඒ අනුව මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල බවත් එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීම සඳහා අමාත්‍යංශ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලැබුණු බවත් ඒ අනුව කටයුතු කළ බවත් සඳහන් කරන ලදි.

ඒ අනුව අදාළ චක්‍රලේඛවලට අනුගත වීමක් සේවකයකු විශේෂ කරගෙන සිදු නොකරන ලද්දක් බව වැඩිදුරටත් පෙන්වා දෙන ලදි.

තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීම සහ තොරතුරු විමසා සිටීම සඳහා දෙවන පාර්ශවයේ සහකාර අධ්‍යක්ෂ පාලන විසින් ඉල්ලා සිටින ලද අතර එහිදී විමසා සිටින ලද්දේ ප්‍රවාහන කොමිෂන් සභාවේ වෙනත් නිලධාරියෙකුට මෙම ගැටලුව පැමිණි විට පළමු පාර්ශවයේ ගණකාධිකාරිවරිය ලෙස ඔබගේ ක්‍රියා මාර්ග කවරේ ද යන්න විමසා සිටින ලදි. ඊට අදාළව පළමු පාර්ශවය විසින් සිය පැහැදිලි කිරීමේ දී කියා සිටියේ,

"මෙම වැටුප ලබා දී තිබෙන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුපක් ලෙස ය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මුලින් අහලා තිබුණා මෙම වැටුප අනුමත ද යන වග. ඊට අදාළව ප්‍රවාහන කොමිෂන් සභාව විසින් (දෙවන පාර්ශවය) ආයතනයේ නිලධාරීන්ගෙන් සිදු වී ඇති අතපසුවීමක් ලෙස සඳහන් කරමින් කරුණු ඉදිරිපත් කරන ලද අතර, එය නිවැරදි කිරීමේ ක්‍රමයක් යෝජනා කරනු වෙනුවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ඊට අදාළ එම වරද කරන ලද නිලධාරීන් කවුරුන් ද යන්න පිළිබඳව විමසීමක් සිදුකර ඇති බව ය. තව ද විගණන අංශයෙන් පවා විමසීම් සිදු කර ඇති අතර එහි දී ද සඳහන් කර ඇත්තේ නිලධාරීන්ගේ වරදක් නොවන බවත් ආයතනයක් වශයෙන් එය නිවැරදි කළ යුතු බවත් ය."

දෙවන පාර්ශවය විසින් ඊට අදාළව පිළිතුරු දීමේ දී දක්වා ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දෙන උපදෙස් අනුව පමණක් කටයුතු කළ හැකි බවත් ඉන් පරිබාහිරව ක්‍රියා කිරීමට හැකියාවක් නොමැති බවත් ය. ඒ අනුව බේරුම්කරු විසින් පහත ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශවයට නියම කරන ලදි.

- 30/2016 චක්‍ර ලේඛනය අදාළ කර ගන්නා විට 2015.12.31 ට පැමිණිලි කාරියගේ කල්පිත ලෙස ගණනය කරන ලද වැටුප ලෙස
- එසේ අදාළ කර ගත් පසු 2016.01.01 පැමිණිලිකාරිය පිහිට විය යුතු වැටුප් තලය
- 2015.12.31 දින වන විට පැමිණිලිකාරිය ලබමින් සිටි අවසාන මූලික වැටුප (උපයාගත් වැටුප් වාරික ද සහිතව)
- එම මුදල 2/2016 අනුව ගැලපුම් දීමනාවක් ලෙස ගෙවා ඇත්නම් එම මුදල
- එම ගැලපුම් දීමනාව මාසික වැටුපට එකතු කොට ගෙවා ඇත් ද නැද්ද යන වග.

එසේම සාක්ෂි සටහන් ප්‍රකාරව තවදුරටත් පැහැදිලි කිරීම් හෝ නැවත පැහැදිලි කර ගැනීම් හා මෙම ආරවුල පිළිබඳව තවදුරටත් විසඳා ගැනීමට අවශ්‍ය වන්නේ නම් සාක්ෂිකරුවන් ඇතුළත් කර දීර්ඝ නඩු විභාගයකට යාමට අවශ්‍ය වන්නේ නම් දෙපාර්ශවයටම ඉදිරි දින දිවුරුම් ප්‍රකාශ මඟින් එකී කරුණු සනාථ කිරීමට නියම කරන ලදි. එහිදී පළමු පාර්ශවය සඳහන් කර සිටියේ තමා ආයතනය තුළ සේවකයකු වන නිසා ආයතනය සමග දිගින් දිගටම මේ පිළිබඳව ගැටළුවක් මතු කරගත හොත් එය රැකියාවට බලපාන බැවින් තවදුරටත් මෙම ආරවුල ඉදිරියට ගෙන යාමට අපේක්ෂා නොකරන බවයි. ඒ අනුව අවසන් වශයෙන් ඉදිරිපත් කරන ලද දෙපාර්ශවයේ දිවුරුම් ප්‍රකාශය මත ප්‍රදානය ලබා දීමට ගරු බේරුම්කරණ තීරණය බව සඳහන් කරමි.

2006/30 (2006.09.22) දිනැති අංක 30 චක්‍රලේඛය) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව යමින් 2006.11.30 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛනය මගින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අනුගමනය කළ යුතු වැටුප් සහ ඊට අදාළ නිර්දේශයන් සහ කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීම අනුමත කොට ඇත.

කෙසේවෙතත් පළමු පාර්ශවය වෙත 2009.01.29 දිනැති පත්වීම් ලිපිය මගින් 2009.02.17 වන දින සිට II ශ්‍රේණියේ ගණකාධිකාරීවරයකු ලෙස රුපියල් 30575 ක ආරම්භක වැටුපකට සේවයට බඳවාගෙන ඇත.

මෙම බඳවා ගැනීමට අදාළව දෙවන පාර්ශවය විසින් 30/2006 චක්‍රලේඛයට අනුව කටයුතු කර නොමැති බව මේ අනුව නිරීක්ෂණය වේ. එනම් ආයතනය තුළ 2006.11.30 දින සිට ක්‍රියාත්මක කරවීමට අනුමත කර ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට පරිබාහිරව පරිපාලනමය කටයුතු කරමින් උක්ත පැමිණිලිකාරිය වෙත පත්වීමක් ප්‍රදාන කොට ඇත. ඒ අවස්ථාව වන විට කොමිෂන් සභාව තුළ ක්‍රියාත්මක විය යුතුව තිබුණේ 30/2006 චක්‍රලේඛයේ නියමයන් හා නිර්දේශයන් විය යුතු වන අතර ඒ අනුව II ගණකාධිකාරිවරයෙකුගේ ආරම්භ වැටුප් තලය ලෙස රුපියල් 25640 ක් ලෙස යන්න පියවර තබා කටයුතු කිරීමට සිදු කළ යුතුව තිබුණි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් රාජ්‍ය චක්‍රලේඛන පිළිබඳව අනවබෝධයෙන් කටයුතු කරමින් මීට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත අනුමත කර තිබු( පළමු පාර්ශවයේ ඇමුණුව III) වැටුප් පරිමාණයට අනුව II ශ්‍රේණියේ ගණකාධිකාරිවරයකු ලෙස බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර එය MM/1/1, රුපියල් 30575 ක වැටුප් තලයක පිහිටුවා ඇති තනතුරට අදාළව බඳවා ගැනීම සිදු කොට ඇත. නමුත් එම ලේඛනය පරීක්ෂා කිරීමේදී II ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරක් වෙනුවට එහි සඳහන්ව ඇත්තේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර ය. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂමේ II ශ්‍රේණිය සඳහා පැමිණිලිකාරිය බඳවා ගෙන ඇති අනුමත තනතුර මෙන්ම ආයතනය තුළ එවකට ක්‍රියාත්මක විය යුතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 30/2006 (2006.11.30) චක්‍රලේඛයේ විධිවිධානයන් ද උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ. තව ද චක්‍රලේඛනයේ VI වගන්තියට අනුව "නව වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමඟ ආයතනයේ කාර්යභාරය අනුව කාර්ය මණ්ඩලය ප්‍රති වර්ගීකරණයට හා බාණ්ඩගත කිරීමට ලක්කර නව වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ අඛණ්ඩව ලබා ගත හැකි වන පරිදි බඳවා ගැනීම් සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලෙස පැහැදිලිව සඳහන් කොට ඇත. 2009.02.17 දින වන විට ක්‍රියාත්මක වෙමින්

පැවතිය යුතු ඉහත චක්‍රලේඛනයේ අඩංගු නියමයන් පිළිබඳව නොසැලකිල්ලෙන් කටයුතු කර ඇති බව ඉහත වගන්තිය අනුව පැහැදිලිව නිරීක්ෂණය වේ. එසේ ම එහි (VIII) වගන්තියේ මින් ඉදිරියට කිසිදු වැටුප් සංශෝධනයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු බවට සඳහන් කොට ඇත."

එසේ ම එහි (XI) වගන්තිය අනුව මේ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට පැහැදිලි කිරීම් හෝ වැඩිදුර උපදෙස් ලබා ගන්නා ලෙස සඳහන් කොට ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2/2016 ක්‍රියාත්මක කරවා ගැනීම් සඳහා පාදක කර ගත යුත්තේ 30/2006 චක්‍රලේඛය වන අතර, ඊට අදාළව 2015.12.31 දිනට අදාළ සේවා ගණය මත වැටුප් කේතය හා වැටුප් ප්‍රමාණය ගණනය කිරීම් සිදු කළ යුතුය.

කෙසේ වුවත් පැමිණිලිකාරිය මෙම තනතුරට බඳවා ගන්නා අවස්ථාවේ දී එකී බඳවා ගැනීම් සිදු කර ඇත්තේ 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක වෙමින් පැවතිය යුතු අවස්ථාවක දීය. එහිදී මූලික වැටුප බඳවා ගන්නා අවස්ථාවේ අදාළ කර ගෙන ඇත්තේ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2006 ට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයකට අනුව වේ. (පැමිණිලිකාරිය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇති ඇමුණුම 3 හා සැසඳේ). (දෙවන පාර්ශවයේ ඇමුණුම 2 හා 3 දිවුරුම් ප්‍රකාශයෙහි (iv) වන වගන්තිය සමඟ සැසඳේ.)

30/2006 චක්‍රලේඛනය එම වර්ෂයේ සිට රාජ්‍ය හා සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ක්‍රියාත්මක කරන ලෙසට මුදල් අමාත්‍යංශය මඟින් උපදෙස් ලබා දී තිබුණි. එහි දී එකී චක්‍රලේඛයට පරිබාහිරව වෙනත් ආයතනගත ක්‍රමවේදයක් තවදුරටත් ක්‍රියාත්මක කිරීම කර ඇති බව නිරීක්ෂණය වේ. 2011.02.28 දිනැති (පැමිණිලිකාරියගේ ඇමුණුම 5) මඟින් ද 2011.03.14 සහ 2011.03.22 දිනැති ලිපි අධ්‍යයනය කිරීමේදී ද පෙනී යන්නේ 30/2006 චක්‍රලේඛයට අනුව වැටුප් පරිවර්ථනය සඳහා ආයතනය අදාළ කාලයේ දී ක්‍රියාකිරීමට අපොහොසත් වීම හේතුවෙන් එය නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යංශය වෙත උපදෙස් ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන පිළිබඳව ද අවධානය යොමු කරමි.

තව ද, 2017.03.13 දිනැති අංක NSCC/02/07/323/SR ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශ ලේකම් අමතන ලද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපියට අනුව 2006.01.01 දිනෙන් පසුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව සඳහා සේවකයන් 32 කු බඳවා ගැනීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කොට ඇත. එම ලිපියේ 3 වන වගන්තිය පහත පරිදි සඳහන් වේ:

"එහෙත් එවකට පැවති දුම්රිය හා ගමනාගමන අමාත්‍යංශ ලේකම් වෙත යොමු කළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ DMS/E/S/MR&T/NTC හා 2006.11.30 දිනැති ලිපියේ (V) වන ඡේදයේ අනුමත වැටුප් ක්‍රමයන්හි ආරම්භක වැටුප් පියවරයන්ට පමණක් බඳවා ගැනීම් සිදුකළ යුතු බවට පැහැදිලිව උපදෙස් දී ඇත"

තව ද, එහි 4 වන වගන්තිය මඟින් එම උපදෙස් නොසලකා ක්‍රියාකළ ඇති නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳවත් ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේ ද යන්නත් විමසා ඇත. මේ අනුව පෙනී යන්නේ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මූලික පරිපාලනමය රීති උල්ලංඝනය කර ඇති බවත් එය රේඛීය අමාත්‍යංශය, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ MSD ආයතනවල පරීක්ෂණයට ලක්වී ඇති බවත් පැහැදිලිව නිගමනය වේ.

ඒ අනුව ආයතනික පරිපාලන දෝෂයන් හේතුවෙන් සේවකයන්ට අගතියට පත්වීම වැළැක්වීම සඳහා පත්වීමේ ලිපියේ අඩංගු කොන්දේසි හුවා දක්වමින් ( එනම් 2009. 01. 29 දිනැති පැමිණිලිකාරියගේ පත්වීම් ලිපියේ 7/8 කොන්දේසි පිළිබඳව සඳහන් කරමින් ආයතනයට අත්තනෝමතිකව කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බව ගරු බේරුම්කරණය නිගමනය කරමි.

පැමිණිලිකාරිය පාරිභෝගික සේවා අධිකාරියේ අභ්‍යන්තර විගණක ලෙස සේවය කරමින් සිටිය දී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගණකාධිකාරි තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ මූලික වැටුප රුපියල් 30575 ක් ලෙස සඳහන්වීම හේතුවෙන් බව දිවුරුම් ප්‍රකාශ මඟින් දක්වා ඇත.

එහිදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව මෙකී තනතුරට බඳවා ගැනීමෙන් පසු 2015.12.31 දක්වාම ඉහත සඳහන් වැටුපට අදාළව සියළුම වරප්‍රසාද ලබාදීමෙන් කටයුතු කර ඇති බව සඳහන් වේ.

කෙසේ වුව ද, ජාතික ගමනාගමන කොමිෂන් සභාව පහත ආකාරයට ක්‍රියා කොට ඇති බැවින් පැමිණිලිකාරියට අගතියක් වී නොමැති බව ගරු බේරුම්කරණය නිගමනය කරයි.

2/2016 චක්‍රලේඛනය සකස්කොට ඉදිරිපත් කරන ලද්දේ 30/2006 චක්‍රලේඛනයට අදාළව ක්‍රියාත්මක කරන ලද ආයතනයන් සඳහා වේ. නමුත් මෙම බඳවා ගැනීම සිදුකර ඇත්තේ 2000.09.11 සහ 2001.10.18 දිනැති MSD චක්‍රලේඛයට අදාළව වේ. එහි දී 2/2016 ට වැටුප් පරිවර්තනය කිරීමට පෙර 30/2006 චක්‍රලේඛනයේ කොන්දේසිවලට අනුව සියලුම සේවකයන්ගේ වැටුප් පරිවර්තනයන් සිදු

කිරීම කල යුතුය. නමුත් NTC එක 2/2016 චක්‍රලේඛනය ක්‍රියාත්මක කිරීමේ දී එම පරිවර්තනයන් ගණනය කිරීම නිවැරදි ලෙස සිදුකර ඇති බව ගරු බේරුම්කරණය නිගමනය කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | 2009.02.17 පත්වීම දෙන විට වැටුප | - | රුපියල් 30575.00 |
| 2. | 2015.12.31 වන විට වැටුප් වර්ධක සහිතව ලද | - | 30575+(735x3)+(925x3) |
| | උපයන ලද වැටුප (ලබමින් සිටි වැටුප) | - | 35555.00 |
| 3. | 30/2006 චක්‍රලේඛයට අනුව 2015.12.31 ට ලැබිය | - | 25640+(665x3)+(735x3) |
| | යුතු වැටුප | - | 29840.00 |
| 4. | 02/2016 අදාළ කර ගන්නා චක්‍රලේඛයට අනුව | - | |
| | 2016.01.01 ලැබිය යුතු වැටුප | | 36157.00 |
| | අන්තර් දීමනාව | - | 9651.00 |
| | | | 45808.00 |
| 5. | නමුත් පැමිණිලිකාරිය 02/2016 ක්‍රියාත්මක කරන විට | - | 42975.00 |
| | ලබමින් සිටි වැටුප | | |
| | අන්තර් දීමනාව | - | 9651.00 |
| | | | 52666.00 |
| 6. | 2016.01.01 දිනට ගැලපුම් දීමනාව සහ ලබන වැටුප් | - | 36157.00 |
| | ගැලපුම් දීමනාව | - | 6858.00 |
| | ගෙවන ලද අන්තර් දීමනාව | - | 9651.00 |
| | | | 52666.00 |

මෙහි දී පළමු පාර්ශවය තම දිවුරුම් ප්‍රකාශය මගින් සඳහන් කර ඇත්තේ තමාගේ වැටුප ගෙවීම් සම්බන්ධයෙන් ආයතනය ගෙන ඇති තීරණය අනුව ඇයට අගතිදායක තත්ත්තවයක් වී ඇති බවය. දෙවන පාර්ශවය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් සඳහන් කර ඇත්තේ පළමු පාර්ශවය සඳහන් කරන ගැටලුව සඳහා ආයතනය මෙතෙක් කටයුතු කර තිබෙනුයේ කළමනාකරණය සේවා දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද උපදෙස් පරිදි බවයි.

පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති සිය දිවුරුම් ප්‍රකාශය මගින් පහත සඳහන් කරුණු අනුව ඇයට අගති දායක තත්ත්වයකට පත්වන බව සඳහන් කොට ඇත.

මෙම කරුණු අනුව පහත සඳහන් පරදි මාගේ බේරුම්කරණ ප්‍රදානය ලබා දෙමි:

I. මූලික වැටුප අඩුවීම,
II. නියමිත වැටුප් වර්ධක ලබා නොදීම හා ඉදිරියේ දී වැටුප් වර්ධක අහිමිකිරීමේ අවධානම,
III. 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය, උපලේඛන ii පිටු අංක සහ XLIV අනුව වැටුප් පරිවර්තනය වගු අනුව 2016 වර්ෂයේ සිට මූලික වැටුප් පියවර 8 ලෙස පදනම් කලවිට නියමිත වාර්ෂික වැටුප් වැඩිවීම් මා හට අහිමි වී ඇත,
IV. මූලික වැටුප පදනම් කරගෙන ආයතනය විසින් ගෙවනු ලබන දීමනා අඩුවෙන් ගණනය කර ගෙවීම (ඉතිරි වෛද්‍ය නිවාඩු දින දීමනා),
V. අහිමි වූ මූලික වැටුප මත හිමි අර්ථසාධක, සේවා නියුක්ති භාර අරමුදල් යන දායක මුදල්, එම දායක මුදල් මත ලැබීමට නියමිත පොලී හා පොලී මත පොලිය මා හට අහිමි වී ඇත,
VI. සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂිත ගෙවීම ගණනය කිරීමේ දී අඩු මූලික වැටුපක් මත ගණනය කිරීමේ අවධානම,
VII. මූලික වැටුප අඩු අගයක් ගැනීම හේතුවෙන් බැංකු ණය ලබා ගැනීමේ දී පවා මා අගතිදායක තත්ත්වයට පත්වීම වේ.

**ප්‍රදානය**

පළමු පාර්ශවය විසින් කරුණු පැහැදිලි කිරීමේ දී පුවත්පත් දැන්වීමකට අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ II ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුර සඳහා පැමිණිලිකාරිය සේවයට බඳවා ගන්නා ලද බව සඳහන් කළ ද අවසන් දිවුරුම් ප්‍රකාශය මගින් එකී පුවත්පත් දැන්වීම ඉදිරිපත් කර නොමැති අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමගම්වල සේවක වැටුප සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පදනම් කර ගනිමින් සහ ඊට අනුගත වෙමින් ආයතනයෙහි සියලුම සේවකයින් වෙත බලපාන පරිදි වැටුප් පරිවර්ථනය සිදුකර ඇති බැවින්, ඒ අනුව පැමිණිලිකාරියට අගතියක් වී නොමැති බව ප්‍රකාශ කර සිටිමි.

08-300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.